**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.04.07 වන දින පැවැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 අප්‍රේල් මස 07 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සූරවීර මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලුදෙනාම ආගම සිහි කර, රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද,ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.** **පසුගිය සභා වාර්තාව සහා සම්මත කිරීම. ( 2022.03.10 )**

2022.03.10 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සහා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

2022.03.10 දින සභාවට තමන් සහභාගී වූ නමුත් සහභාගී වූ මන්ත්‍රී ලැයිස්තුවෙහි නම සඳහන් නොවී ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ප්‍රකාශ කළ සිටියේ පරිසර කමිටුව අවස්ථා තුනක දී පමණක් කැඳවූ බව පැවසූ නමුත් එය සභා වාර්තාවෙහි සඳහන් වී නොමැති බවත් , සභාවේ ගන්නා තීරණ සභාව මගින් ක්‍රියාත්මක විය යුතු බවත් , අර්ථය නිවැරදිව පැහැදිලි වන ආකාරයට සඳහන් කළ යුතු බවත් ය.

ඒ අනුව 2022.03.10 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඈන්තනී මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

වර්තමානය වන විට රට තුළ පවතින විදුලි අර්බුදයට මුහුණ දීම සඳහා රජයට සහයෝගය දැක්වීමට බල ප්‍රදේශය තුල වීථි පහන් භාවිතය 50 % කින් පහත හෙළීමට කටයුතු කරන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් එවා ඇති 2022.03.06 දිනැති අංක ACLG 04/03/05 ලිපිය ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරමින් හැකි පමණ විදුලිය භාවිතා කිරීම පාලනය කරන ලෙසත් , සියලු දෙනා ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසත් , අවශ්‍ය ස්ථාන වල පමණක් වීථි පහන් දල්වන ලෙසත් ඉල්ලා සිටින ලදී.

**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>

**01.** ගරු නිතිඥ පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය විසින් රිල්හේන ග්‍රාම නිලධාරී වසමට නව සේවා පියසක් ඉදිකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවට අයත් මහපාරගාවහේන නැමති ඉඩම වෙන් කර ඇති බව ලිපියකින් දන්වා ඇති බවටත් , ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා සභා තීරණය එවන ලෙසටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලිපියක් එවා ඇත.ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ රිල්හේන ග්‍රාම නිලධාරී වසමට සේවා පියසක් අවශ්‍ය බවට ඉල්ලීම් කර ඇති බවත් , මේ සම්බන්ධව මීට පෙර සාකච්ඡා කළ බවත් , ඒ සඳහා අවස්ථාව ලබා දිය යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ඉහත යෝජනාවෙහි "ඉඩම වෙන් කර ඇති බව" යන ස්ථානයට "ඉඩම යෝජනා වී ඇති බව" ලෙස සංශෝධනය වීම සුදුසු බව ය.

<u>තීරණ අංක 01</u>
පැල්මඩුල්ල රිල්හේන ග්‍රාම නිලධාරී වසමට නව සේවා පියසක් ඉදිකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවට අයත් මහපාරගාවහේන නැමති ඉඩම ලබා දීමට කැමැත්ත පල කර , ඉදිරි කටයුතු කිරීම සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට ලිපියක් යැවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සඳහා සකස් කළ සේවාලාභී ප්‍රඥප්තිය අනුමත කිරීම සඳහා සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 02</u>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව සඳහා සකස් කළ සේවාලාභී ප්‍රඥප්තිය අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පවතින පොදු නාන ස්ථාන හඳුනා ගෙන නඩත්තු කිරීම සඳහා පොදු නාන ස්ථාන සම්බන්ධව කොට්ඨාස මට්ටමින් ගරු මන්ත්‍රීවරුන්ගෙන් තොරතුරු ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 03</u>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පවතින පොදු නාන ස්ථාන හඳුනා ගෙන නඩත්තු කිරීම සඳහා පොදු නාන ස්ථාන සම්බන්ධව කොට්ඨාස මට්ටමින් ගරු මන්ත්‍රීවරුන්ගෙන් තොරතුරු ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී වෙන්දේසි කරන ලෙස නිර්දේශ කළ නමුත් තක්සේරු කිරීමේ කමිටුව විසින් ගල්ලෙපිට ආදාහනාගාරයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ පිටු අංක 6 හි ඇති 10kw ජෙනරේටරය ( S-N-106-1018-E ) අලුත්වැඩියා කරන ලෙස නිර්දේශ කර ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 04**

ගල්ලෙපිට ආදාහනාගාරයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ පිටු අංක 6 හි ඇති 10kw ජෙනරේටරය (S-N-106-1018-E) 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී වෙන්දේසි කරන ලෙස නිර්දේශ කළ නමුත් තක්සේරු කිරීමේ කමිටුව විසින් අලුත්වැඩියා කරන ලෙස කළ නිර්දේශය සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** ආදායම් පරීක්ෂකතුමියගේ වාර්තාව සලකා බලා , පහත දේපල හිමිකරුවන්ගේ දේපළ සඳහා නව වරිපනම් අංක ලබා දීම සම්බන්ධ යෝජනාව අනුමත කිරීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

| අනු අංකය | මුල් ඉඩමේ වරිපනම් අංකය | මාර්ගය | වරිපනම් ලේඛනය පරිදි අයිතිකරු | යෝජනා කරනු ලබන අංකය | ලේඛනයේ අතුලත් විය යුතු අයිතිකරු | දේපල විස්තරය | වාර්ෂික වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 01 | 312 | බලංගොඩ පාර දකුණ | අයිතිකරු හි.කි.බී.ඒ. ධර්මසේන | 312 B | එම්.එම්.රෝෂිණී සෝමරත්න | තේ ඉඩම | 250 .00 |
| 02 | 50 | ධර්මපාල මාවත දකුණ | එස්.එන්. මොහොට්ටිහාමි හි.කි.ඩබ්.ඒ.ඩී.එස්. වනිගසුන්දර | 50 A | ඩබ්.ඒ.ඩී.අරවින්ද ඉරේෂ් වනිගසුන්දර | කොන්ක්‍රීට් වහලය සහිත බිම් මහල | 23,285.00 |
| 03 | 3/8 | ධර්මපාල මාවත දෙවන පටුමග වම | කේ.ධර්මවර්ධන , කේ.ඒ.ධනපාල | 3/8/ඒ | එම්.එම්.රෝෂිණී සෝමරත්න | ඇස්බැස්ටස් සෙවිලි හා කොන්ක්‍රීට් වහලය සහිත නිවස | 9,657 .00 |
| 04 | - | රක්වාන පාර වම | - | 407/4 | පී.මාරිමුත්තු | ඇස්බැස්ටෝස් වහලය සහිත නිවස | 9,065 .00 |
| 05 | - | රත්නපුර පාර වම | - | 2007/7 | කේ.ඒ.පියරත්න කහදවලආරච්චි | ඇස්බැස්ටෝස් වහලය සහිත නිවස | 22,630.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05**

ආදායම් පරීක්ෂකතුමියගේ වාර්තාව සලකා බලා , ඉහත දේපල හිමිකරුවන්ගේ දේපළ සඳහා ඉහත පරිදි නව වරිපනම් අංක ලබා දී වාර්ෂික වටිනාකම අනුව වරිපනම් බදු අය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** 2021.12.09 දින මහා සභාවේ තීරණ අංක 15 අනුව දීර්ඝ කාලයක් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් අතුරු බදු දෙමින් පවත්වාගෙන ගිය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් 11/1 කඩ කාමරය සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යොමු කළ ලිපිය සලකා බලා පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් අංක ACLG 6/3/2 හා 2022.03.11 දිනැති ලිපිය එවා ඇත. පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙනුවෙන් නම් කර එවන ලද නිලධාරීන් දෙදෙනාත් සම්බන්ධ කර ගනිමින් සභාව විසින් සුදුසු නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර එහි නිරීක්ෂණය සමග තීන්දුවක් ගැනීම සුදුසු බවට එමගින් දැනුම් දී ඇත.ඒ අනුව ඒ සඳහා පත් කරන ලද පහත කමිටුව අනුමත කිරීම සඳහා සභාවට ඉදිරිපත් කරමි.

1.ඩබ්.එන්.කේ.ශාන්ති මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
2.ජේ.සී.ඒම්.විජේපාල මයා - විමර්ෂණ නිලධාරී
3.ජී.ඒ.බී.ජී.ප්‍රේමරත්න මයා - ප්‍රධාන කළමනාකරණ සහකාර
4.ඩී.පී.එස්.සංජීව මයා - සංවර්ධන නිලධාරී
5.යූ.ජී.ඩී.ඩබ්.උඩගෙදර මිය - ආදායම් පරීක්ෂක

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉහත නිලධාරීන් ස්වාධීනව සියලු ලිපි ලේඛන පරීක්ෂා කර බලා ලබා දෙන වාර්තාව සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් , ඒ අනුව තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් ය.

**තීරණ අංක 06**

දීර්ඝ කාලයක් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් අතුරු බදු දෙමින් පවත්වාගෙන ගිය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් 11/1 කඩ කාමරය සම්බන්ධව නිරීක්ෂණය සමග තීන්දුවක් ගැනීම සඳහා පත් කරන ලද ඉහත නිලධාරින්ගෙන් සමන්විත කමිටුව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**07.** පැල්මඩුල්ල පොදු වෙළෙඳපොල කඩ කාමර නීත්‍යානුකූල නොවන ආකාරයට අන්සතු කර ඇති බවට 2021.12.06 දින ස්ථානීය පරීක්ෂණයෙන් නිරීක්ෂණය වූ බව විගණනයෙන් පෙන්වා දී ඇති අතර ඒ අනුව 2022.03.05 දින පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂකතුමිය විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණය ද සලකා බලා නීත්‍යානුකූල නොවන ආකාරයට අන්සතු කර ඇති පැල්මඩුල්ල පොදු වෙළෙඳපොල කඩ කාමර සම්බන්ධව ප.පා.කො.03/2020 චක්‍රලේඛයේ 10 වන වගන්තිය ප්‍රකාරව හෝ සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 07**

නීත්‍යානුකූල නොවන ආකාරයට අන්සතු කර ඇති පැල්මඩුල්ල පොදු වෙළෙඳපොල කඩ කාමර සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය නියෝජනය කරමින් විමර්ශණ නිලධාරීතුමා හා ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය ද , පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂකතුමිය ද ඇතුලුව කමිටුවක් පත් කර පරීක්ෂණයක් පවත්වා , කමිටුව විසින් ලබා දෙන නිර්දේශ සහිත වාර්තාව මහා සභාවට ඉදිරිපත් කර මේ සම්බන්ධව නිශ්චිත තීරණයක් ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**08.** 2014.10.16 මාසික මහා සභා රැස්වීමේ තීරණ අංක 10 පරිදි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු බල ප්‍රදේශය තුළ රු.7,000.00 ලෙසත් , බල ප්‍රදේශයෙන් පිටත රු.8,000.00 ලෙසත් තීරණය කර ඇත.මේ දක්වා කිසිදු වැඩිවීමක් සිදු නොවී ඇති අතර වත්මන් කාලයේ ගෑස් වල මිල වැඩි වීමත් සමඟ උක්ත මුදලට අදාලව අදාහන සිදු කළ නොහැකි බැවින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු බල ප්‍රදේශය තුළ රු.8,000.00 ලෙසත් බල ප්‍රදේශයෙන් පිටත රු.10,000.00 ලෙසත් මුදල් සංශෝධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු ආරම්භයේ සිට ම වැඩි වීමක් සිදු නොවී ඇති බවත් , එම කාලයේ පැවති ගෑස් මිල සලකා බලා එම ගාස්තු තීරණය කර ඇති බවත් , වත්මනෙහි රට තුල පවතින ගෑස් මිල සලකා බලා මුදල් වැඩි කිරීමට තීරණය කළ බවත් ය.යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් කරන අවස්ථාවේ පැවති ගෑස් මිල සලකා බලා මෙම මුදල් තීරණය කළ නමුත් සභාව පවත්වන අද දිනය වන විට ගෑස් එකක මිල රු.13,143.00 ක් දක්වා තව දුරටත් ඉහළ ගොස් ඇති බැවින් නැවත මුදල් සංශෝධනය කිරීමට සිදු වන බවත් , 2022 මැයි 01 වනදා සිට එනම් බල ප්‍රදේශය තුළ රු.10,000.00 ලෙසත් බල ප්‍රදේශයෙන් පිටත රු.12,000.00 ලෙසත් ආදාහනාගාරයේ ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා ප්‍රකාශ කළ සිටියේ බලංගොඩ හා රත්නපුර පවතින ආදාහනාගාර වල ගාස්තු සලකා බලා මුදල් සංශෝධනය කිරීම සුදුසු බව ය.

ආදාහනාගාරයේ සේවාව ලබා ගැනීමට ඉතා පිටිසර ගම් වල සිට ජනයා පැමිණෙන බැවින් ගාස්තු වැඩි කිරීම ඔවුන්ට දරා ගත නොහැකි බවත් , එනිසා ආදාහනාගාරයේ මුදල් සංශෝධනය කිරීම යෝජනාවෙහි සඳහන් කර ඇති මුදලට සිදු කිරීම සුදුසු බවටත් , තව දුරටත් මුදල් වැඩි කිරීම සුදුසු නොවන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටින ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ තමන් ද පවතින මුදලට ම ආදාහනාගාරයේ සේවාවන් සැපයීමට කැමති බවත් , නමුත් ගෑස් මිල වැඩි වීම හා විටින් විට ආදාහනාගාරයේ නඩත්තු කටයුතු කිරීමට සිදු වීම හේතුවෙන් පවතින මුදලට සේවාව සැපයීම අපහසු බවත් , ගාස්තු වැඩි නොකළහොත් ඉදිරියේ දී ආදාහනාගාර කටයුතු සිදු කිරීමට නොහැකි වන බවත් , ඉදිරියේ දී ගෑස් වල මිල අඩු වුවහොත් නැවත අදාහනාගාර ගාස්තු වල මිල අඩු කර ස්ථිර වශයෙන් ම ජනයාට සහනයක් ලබා දීමට කටයුතු කරන බවත් ය.

ගෑස් එකකින් ආදාහන කොපමණ ප්‍රමාණයක් සිදු කළ හැකි ද යන්න ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය විමසා සිටින ලදී.ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගෑස් එකකින් ආදාහන 2 ක් සිදු කළ හැකි බවත් , තව ගෑස් සුළු ප්‍රමාණයක් ඉතිරි වන බවත් , 3 වන ආදාහනය සිදු කිරීම සඳහා නව ගෑස් එකක් අවශ්‍ය වන බවත් ය.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ මේ අවස්ථාවේ දී මිනිසුන්ට සහනයක් ලබා දිය යුතු බවත් , ඉන්ධන පෝලිම් වල ගෑස් පොලිම් වල මිනිසුන් අපහසුතාවයට පත් වන බවත් , භාණ්ඩ වල මිල ගණන් මිනිසුන්ට දරා ගත නොහැකි බවත් ය.එනිසා මෙහි දී විසඳුම ආදාහනාගාරයේ මිල වැඩි කිරීම හෝ විදී පහන් දැල්වීම අඩු කිරීම හෝ නොවන බවත් , මිනිසුන්ට සහනයක් ලබා දීමට කටයුතු කළ යුතු බවත් එතුමා පවසන ලදී.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 08**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලයේ බහුතර කැමැත්ත අනුව 2022.05.01 වන දින සිට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ලෙපිට ආදාහනාගාරයේ ගාස්තු බල ප්‍රදේශය තුළ රු.10,000.00 ලෙසත් බල ප්‍රදේශයෙන් පිටත රු.12,000.00 ලෙසත් මුදල් සංශෝධනය කිරීම සුදුසු බවට සභා සම්මත විය.

**09**. 2022.03.10 දින සභාවේ හදිසි යෝජනා යටතේ තීරණ අංක 19 පරිදි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයිති මාරපන කහවිටිගොඩ සුසාන භූමියේ ඇති කොස් ගස් හතර කපා ඉවත් කර එම ස්ථානයේ ම වෙන්දේසි කිරීමට ඉදිරිපත් වූ තීරණය අනුව කාර්මික නිලධාරී මහතා විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ගසෙහි වට අඩි ප්‍රමාණය හා උස සලකා බලා දැව වටිනාකම පහත පරිදි වන බවට නිර්දේශ කර ඇති අතර එම වාර්තාව සලකා බලා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

| ගසෙහි නම | නිර්දේශ කර ඇති දැව වටිනාකම |
|---|---|
| කොස් ගස 01 | රු. 65,900.00 |
| කොස් ගස 02 | රු.124,925.00 |
| කොස් ගස 03 | රු. 65,000.00 |
| කොස් ගස 04 | රු. 54,200.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

කාර්මික නිලධාරීතුමා විසින් අවම ලංසුව ඉදිරිපත් කර ඇති බව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසන ලදී.

**තීරණ අංක 09**

ස්ථානීය පරීක්ෂණ වාර්තාව සලකා බලා , පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයිති මාරපන කහවිටිගොඩ සුසාන භූමියේ ඇති කොස් ගස් හතරෙහි වට අඩි ප්‍රමාණය හා උස සලකා බලා කාර්මික නිලධාරී මහතා නිර්දේශ කර ඇති දැව වටිනාකම අනුව එම කොස් ගස් හතර වෙන්දේසි කිරීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10**. පහත නම් සඳහන් වෙළඳ හිමියන්ගේ ඉල්ලීමට අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සිදු කරන ලද පරීක්ෂාව අනුව දෛනිකව බැහැර කරනු ලබන කසල ප්‍රමාණය 50 kg ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පවතින බවත් , පවතින කොවිඩ් වසංගත තත්ත්වය නිසා වෙළෙඳ ස්ථාන සඳහා ප්‍රජාව යොමු නොවන බව නිරීක්ෂණය වූ බවත් වාර්තාවෙහි සඳහන් කර ඇත. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ වාර්තාව සලකා බලා එම ආයතන 2021 අප්‍රේල් මස සිට කසල බදු ගෙවීමෙන් නිදහස් කිරීමටත් , 50 kg ප්‍රමාණය ඉක්මවා දෛනික කසල බැහැරලීම නිරීක්ෂණය වුවහොත් කසල බදු අය කිරීම සුදුසු බවටත් යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 01. ගුරුදොළ බේකරිය | - | ගුරුදොළ, පැල්මඩුල්ල. |
| 02. දමයන්ති වෙළඳසැල | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 03. ෆුඩ් කැබින් | - | නො 89, කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 04. ජේ.එම්.සුපර් සෙන්ටර් | - | නො 79,කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 05. සම්පත් ග්‍රොසරි | - | නො 05, බලංගොඩ පාර, පැල්මඩුල්ල. |
| 06. යූ.එන්.ටී.පළතුරු කඩය | - | රක්වාන පාර, පැල්මඩුල්ල. |
| 07. ෆියෙස්ටා හොටෙල් | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 08. ශාන්ත පළතුරු කඩය | - | රක්වාන පාර, පැල්මඩුල්ල. |
| 09. ගංගා පළතුරු කඩය | - | රක්වාන පාර, පැල්මඩුල්ල. |
| 10. නිම්සර හෝටලය | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 11. බොරාල තොග කඩය | - | රක්වාන පාර, පැල්මඩුල්ල |
| 12. තුෂාර වෙළඳසැල | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 13. උදය තොග කඩය | - | නො 48, කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 14. .තුෂාර තොග එළවළු කඩය | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 15. බුද්ධික එළවළු කඩය | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 16. බුද්ධික සුපර් සෙන්ටර් | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 17. බණ්ඩාරවෙල එළවළු කඩය | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 18. පාලිත හෝටලට | - | නො 03, බලංගොඩ පාර, පැල්මඩුල්ල. |
| 19. ජන්සන් හෝටලය | - | බලංගොඩ පාර, පැල්මඩුල්ල. |
| 20. ඒ.ඩබ්.ගයාෂාන් මධුසංඛ වෙළඳසැල | - | වැලිමළුව, ලෙල්ලෝපිටිය. |
| 21. නයගරා හෝටලය | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 22. දික්වැල්ල හෝටලය | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |
| 23. දිසල්ගා පළතුරු කඩය | - | කෙළින්වීදිය, පැල්මඩුල්ල. |

24. බී.ඒ.චමින්ද (පළතුරු කඩය) - වැලිමළුව, ලෙල්ලෝපිටිය.
25. උපුල් කොඩිතුවක්කු (හෝටලය) - පාතකඩ, පැල්මඩුල්ල.
26. කේ.කේ.ආරියවංශ (රිල්හේන පළතුරු කඩය) - 240/1, රිල්හේන, පැල්මඩුල්ල.
27. CFC හෝටලය - බලංගොඩ පාර, පැල්මඩුල්ල.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 10**

ඉහත නම් සඳහන් වෙළඳ හිමියන්ගේ ඉල්ලීමට අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සිදු කරන ලද පරීක්ෂණ වාර්තාව සලකා බලා දෛනිකව බැහැර කරනු ලබන කසල ප්‍රමාණය 50 kg ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතීම , පවතින කොවිඩ් වසංගත තත්ත්වය නිසා වෙළෙඳ ස්ථාන සඳහා ප්‍රජාව යොමු නොවීම යන කරුණු හේතුවෙන් එම ආයතන 2021 අප්‍රේල් මස සිට කසල බදු ගෙවීමෙන් නිදහස් කිරීම සුදුසු බවටත් , 50 kg ප්‍රමාණය ඉක්මවා දෛනික කසල බැහැරලීම නිරීක්ෂණය වුවහොත් කසල බදු අය කිරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**11.** වැල්සිරිගම, ගනේගම, පැල්මඩුල්ල ලිපිනයෙහි ඇති ගවේෂණ ඩිහයිඩ්‍රේටඩ් ෆුඩ් ආයතය 2022 ජනවාරි මස සිට වසා තබා ඇති බවට කරන ලද ඉල්ලීම මත මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් සිදු කරන ලද පරීක්ෂාව අනුව එම වෙළෙඳසැල 2022 ජනවාරි මස සිට වසා ඇති බැවින් අප සභාව වෙත කසළ ලබා නොදුන් බවට නිරීක්ෂණය වූ බව වාර්තා කර ඇත.ඒ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ වාර්තාව සලකා බලා සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 11**

මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් සිදු කරන ලද පරීක්ෂණ වාර්තාව සලකා බලා වැල්සිරිගම , ගනේගම , පැල්මඩුල්ල ලිපිනයෙහි ඇති ගවේෂණ ඩිහයිඩ්‍රේටඩ් ෆුඩ් ආයතනය 2022 ජනවාරි මස සිට වසා ඇති බැවින් කසල බදු ගෙවීමෙන් නිදහස් කිරීම සුදුසු බවටත් , දෛනික කසල බැහැරලීම නිරීක්ෂණය වුවහොත් කසල බදු අය කිරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**12.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය තුල දෛනික කසල කළමනාකරණයේ දී ඇති වන ගැටලු මගහරවා ගැනීම සඳහා කසල එකතු කිරීමටත් , කොම්පෝස්ට් අංගනයේ කටයුතු කිරීමටත් සුදුසු සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙක් බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 12**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට කුලී පදනම යටතේ බඳවා ගෙන සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරුවෙක් වන බර වාහන රියදුරු බලපත්‍රයක් හිමි එම්.වී.චතුර චමින්ද කුමාර යන අයව ට්‍රැක්ටර් රථ රියදුරෙකු ලෙස බඳවා ගැනීමට තීරණය කිරීම හා සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙක් සේවයට වාර්තා නොකිරීම නිසා සේවයෙන් ඉවත් කර තිබීම හේතුවෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශය තුල දෛනික කසල කළමනාකරණයේ දී ඇති වන ගැටලු මගහරවා ගැනීම සඳහා කසල එකතු කිරීමටත් , කොම්පෝස්ට් අංගනයේ කටයුතු කිරීමටත් සුදුසු සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙක් කුලී පදනම මත බඳවා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**13**. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට දෛනික කසළ කළමනාකරණයට ප්‍රමාණවත් රියදුරන් නොමැති වීම නිසා පවතින ගැටළුකාරී තත්වය මගහරවා ගැනීමට 2022.03.10 දින සභාවේ තීරණ අංක 18 පරිදි දැනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට කුලී පදනම යටතේ බඳවා ගෙන සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරුවෙක් වන බර වාහන රියදුරු බලපත්‍රයක් හිමි එම්.වී.චතුර චමින්ද කුමාර යන අයව ට්‍රැක්ටර් රථ රියදුරෙකු ලෙස බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 13**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට දෛනික කසළ කළමනාකරණයට ප්‍රමාණවත් රියදුරන් නොමැති වීම නිසා පවතින ගැටළුකාරී තත්වය මගහරවා ගැනීමට 2022.03.10 දින සභාවේ තීරණ අංක 18 යටතේ , දැනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට කුලී පදනම යටතේ බඳවා ගෙන සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරුවෙක් වන බර වාහන රියදුරු බලපත්‍රයක් හිමි එම්.වී.චතුර චමින්ද කුමාර යන අයව ට්‍රැක්ටර් රථ රියදුරෙකු ලෙස බඳවා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පවතින ට්‍රැක්ටර් රථ රියදුරු පුරප්පාඩු හේතුවෙන් 2022.03.10 දින සභාවේ තීරණ අංක 18 පරිදි බරවාහන රියදුරු බලපත්‍රයක් හිමි දැනට රැකියාවක් නොකරන කේ.එන්.ඉෂාම් ජයසේකර යන අයව ට්‍රැක්ටර් රථ රියදුරෙකු ලෙස බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පවතින ට්‍රැක්ටර් රථ රියදුරු පුරප්පාඩු හේතුවෙන් 2022.03.10 දින සභාවේ තීරණ අංක 18 යටතේ , බරවාහන රියදුරු බලපත්‍රයක් හිමි දැනට රැකියාවක් නොකරන කේ.එන්.ඉෂාම් ජයසේකර යන අයව ට්‍රැක්ටර් රථ රියදුරෙකු ලෙස බඳවා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**15.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වසම් මට්ටමින් තෝරා ගත් පවුල් සඳහා බීජ ලබා දීමේ වැඩසටහන සඳහා සමබන්ධ වන එම පවුල් සඳහා නොමිලේ කොම්පෝස්ට් පොහොර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 15</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ වසම් මට්ටමින් තෝරා ගත් පවුල් සඳහා බීජ ලබා දීමේ වැඩසටහන සඳහා සම්බන්ධ වන එම පවුල් සඳහා නොමිලේ කොම්පෝස්ට් පොහොර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.**යහල්දොල අලුතින් ඉදිකරන ලද පාලමේ සිට අඩි 105ක් ඉදිරියට හා අඩි 9 ක් පළලට පමණ මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 16</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , යහල්දොල අලුතින් ඉදිකරන ලද පාලමේ සිට අඩි 105ක් ඉදිරියට හා අඩි 9 ක් පළලට පමණ මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**17.** පැල්මඩුල්ල කොට්ඨාසයේ වාරිගම 168 / C වසමේ සකිකන්ද ගමේ දකුණු පස ඉහල කොටසේ නිවෙස් වලට හා ඉඩම් ගණනාවකට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 17</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , පැල්මඩුල්ල කොට්ඨාසයේ වාරිගම 168 / C වසමේ සකිකන්ද ගමේ දකුණු පස ඉහල කොටසේ නිවෙස් වලට හා ඉඩම් ගණනාවකට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**18.**කපුහේන්තොට වසමේ හල්පාවල අළුබෝගහහේන මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 18</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , කපුහේන්තොට වසමේ හල්පාවල අළුබෝගහහේන මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**19.** පහත නම් සඳහන් අඩු ආදායම්ලාභී අය හට වැසිකිලි ආධාර ලබා දීමට යෝජනා කරමි.

- කේ.පී.සමන් කුමාර , මිදිගහමුල්ල , පාතකඩ , පැල්මඩුල්ල.
- මයුරා විජේසිංහ , නිවාස 20 , නාරංගොඩ , පැල්මඩුල්ල.
- යූ.පියල් ලියනගේ , බැරැන්ඩුව , පැල්මඩුල්ල.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 19</u>**

ස්ථාන පරීක්ෂකගේ හා අවශ්‍ය අයගේ නිර්දේශයන් සහිතව ඉහත නම් සඳහන් අඩු ආදායම්ලාභී අයහට වැසිකිලි ආධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**20.** සිංගප්පුලිකන්ද,පාතකඩ,පැල්මඩුල්ල පදිංචි අඩු ආදායම්ලාභී මෙන්ම රෝගාතුර වීම හේතුවෙන් නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා ආර්.එච්.සුගතදාස යන අයගේ බිරිඳ සඳහා උපකාරයක් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 20**

වෛද්‍ය වාර්තා සලකා බලා සිංගප්පුලිකන්ද ,පාතකඩ ,පැල්මඩුල්ල පදිංචි අඩු ආදායම්ලාභී මෙන්ම රෝගාතුර වීම හේතුවෙන් නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා ආර්.එච්.සුගතදාස යන අයගේ බිරිඳ වන පී.එම්.ප්‍රේමවතී යන අය සඳහා රු.5,000.00 ක වෛද්‍ය ආධාරයක් අවශ්‍ය අනුමැතිය යටතේ ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**21 .**පහත ඇස්තමේන්තු අනුමත කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

1.රිල්හේන සමඟි මාවතේ පස්වන පටුමග කොන්ක්‍රීට් කිරීම. - රු.126,600.00
2. නාරගොඩ සමුද්‍රි පාලමේ අත් වැල අලුත්වැඩියා කිරීම - රු.110,000.00
3.මාරපන මාවුදැල්ල වසමේ කොළණිය පාර පෙරමුසු තාර මිශ්‍රණය දමා සකස් කිරීම. - රු.342,000.00

4.මාරපන ගල්ලින්න - පැල්වාඩිය පාර කිලෝ මීටර් 2ක් පෙරමුසු තාර මිශ්‍රණය දමා සකස් කිරීම. - රු.189,278.10

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා පවසා සිටියේ 3 හා 4 යෝජනා සඳහා ද්‍රව්‍යාධාර පමණක් ඉල්ලූ බවත් , පුහුණු ශ්‍රමය අවශ්‍ය වුවත් කම්කරු කුලිය අවශය නොවන බැවින් එය සංශෝධනය විය යුතු බව ය.

**තීරණ අංක 21**

ඉහත ඇස්තමේන්තු අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්ත දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමාගේ යෝජනා.**

**01.**කහවත්ත පොදු වැසිකිළිය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 22**

කහවත්ත පොදු වැසිකිළිය ප්‍රතිසංස්කරණය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්ත දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ කහවත්ත පොදු වැසිකිළිය ගරා වැටී ඇති බවත් , නඩත්තු කර ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ ලබා දී සභාවට ආදායම උපයා ගැනීම සුදුසු බව ය.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ජල බිල්පත් ගෙවා ඇති ද යන්න සොයා බලා ගෙවා නොමැති නම් ගෙවා සම්පූර්ණ කළ යුතු බවත් , මේ ආකාරයට ගරා වැටීමට හේතුව අනවශ්‍ය ලෙස ජල පරිභෝජනය නිසා ලක්ෂ ගණන් ජල බිලපත් පැමිණීම බවත් , ජල සැපයුම විසන්ධි කළ පසුව නඩත්තුව නොමැති වූ බවත් , සුළු මුදලකට හෝ ටෙන්ඩර් දී සභාවට ආදායමක් ලබා ගත යුතු බවත් , එවිට නඩත්තු කටයුතු සිදු වන බවත් ය.

**02.**කට්ටංගේ දාන්දාව එක්සත් සහයෝගිතා සමිතිය සඳහා වැසි ආවරණ මඩුවක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 23**

අවශ්‍ය අයගේ නිර්දේශයන් සහිතව මිල ගණන් කැඳවා කට්ටංගේ දාන්දාව එක්සත් සහයෝගිතා සමිතිය සඳහා වැසි ආවරණ මඩුවක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමාගේ යෝජනා.**

**01.**බුලත්වත්ත ජයසේන මහතාගේ නිවසේ සිට සුනිල් මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීමට අදාල රු.54.000.00 ක මැනුම් ගාස්තු රත්නපුර- ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා පවසා සිටියේ නිවාස දහයකට පමණ යන ගම් සභා පාරක් බවත් එනිසා මෙම මුදල් ගෙවිය යුතු බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පරණ ගම් සභා පාරක් බවත් , විෂය පථයට අදාල කාරණයක් බවත් , මාර්ගය සාදා දෙන ලෙස ජනතාවගේ විශාල ඉල්ලීමක් ඇති නිසා මාර්ගය මැනිය යුතු බවත් , ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මැනුම් නියෝගයක් සිදු කර ඇති බවත් , මැනුම් ගාස්තු සභාවෙන් ගෙවිය යුතු බවත් ය.

පනතෙන් සභාවට පැවරෙන කරුණක් නිසා සභාවෙන් මැනුම් ගාස්තු ගෙවීමට සිදු වන බව ගරු විපක්ෂනායකතුමා ද පවසන ලදී.

<u>තීරණ අංක 24</u>
බුලත්වත්ත ජයසේන මහතාගේ නිවසේ සිට සුනිල් මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීමට අදාල රු.54,000.00 ක මැනුම් ගාස්තු රත්නපුර - ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිය වෙත ගෙවීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**IV. <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරතොට ග්‍රාම සේවක වසමේ මොරතොට - ඕපනායක ලිපිනය මොරතොට - පැල්මඩුල්ල වශයෙන් ලිපිනය වෙනස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ එය රාජ්‍ය සේවකයන්ට ද විශාල ගැටලුවක් වී ඇති බව ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එම යෝජනාව සුදුසු බවත් , රාජ්‍ය පරිපාලන අමාත්‍යශෙයෙන් ගැසට් කර ඇති නිසා ඒ සම්බන්ධව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ලිපියක් යොමු කළ යුතු බවත් ය.

<u>තීරණ අංක 25</u>
පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරතොට ග්‍රාම සේවක වසමේ මොරතොට - ඕපනායක ලිපිනය මොරතොට - පැල්මඩුල්ල වශයෙන් ලිපිනය වෙනස් කරන ලෙස ඉල්ලා රාජය පරිපාලන අමාත්‍යාංශයට ලිපියක් යැවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක වාර්ථා සලකා බැලීම - 2022-03-10 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2022-03-10 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-03-01 සිට 2022-03-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

2022-03-01 සිට 2022-03-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව , ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**08.** වෙනත් කරුණු.

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

<u>ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.</u>

අදහස් දක්වමින් විපක්ෂනායකතුමා පවසා සිටියේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් කෙටේතැන්න කසළ මධ්‍යස්ථානය සඳහා යාමට ඇති මාර්ගය පිළිබඳව අවධානය යොමුකර කොන්ක්‍රීට් කර සංවර්ධනය කළ යුතු බවය.

උත්සව සමය නිසා අප්‍රේල් 20 වනතුරු බල ප්‍රදේශය තුළ වීථි පහන් දැල්වීම සක්‍රිය කළ යුතු බවත් , මිනිස්සු සැහෙන ලෙස පීඩාවට පත් වී ඇති අවස්ථාවක් නිසා සොර සතුරු කරදර ඇති විය හැකි බවත් , උදෑසන 6.00 න් පසුව අනවශ්‍ය ලෙස දැල්වෙන වීථි පහන් නිවා දැමීමට කටයුතු කළ යුතු බවත් , අවුරුදු සමයෙන් පසුව වීථි පහන් දැල්වීම අඩු කිරීම සුදුසු බවත් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එය නිවැරදි බවත් , වීථි පහන් සවි කළ පසු එය නිවා දැමීමේ වගකීම වීථි පහන අසල ජීවත් වන හෝ කිසියම් පුද්ගලයෙකුට භාර දී තිබිය යුතු බව ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා.**

පැල්මඩුල්ල ආසනයට විශාල සේවයක් කළ , ආදරණීය දේශපාලනඥයෙක් වන ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමාගේ පවුලේ සියලු දෙනාටම මුළු සභාවේ ම ශෝකය ප්‍රකාශ කරමින් පණිවිඩයක් යැවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටින ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා පැල්මඩුල්ල බල ප්‍රදේශයේ සිටි ඉතාමත් නිහතමානී මෙන් ම පැල්මඩුල්ලට විශාල සේවයක් කළ , ජනතාව වෙනුවෙන් කැප වූ නායකයෙක් බවත් , එතුමාගේ සේවය ඉහළින් ම අගය කළ යුතු බවත් , එතුමාගේ වියෝව සම්බන්ධයෙන් මුළු සභාවේ ම ශෝකය ප්‍රකාශ කරන බවත් ය.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ තමන් ඊළඟ සභා වාරයේ දී මෙම කරුණ න්‍යාය පත්‍රයට ශෝක යෝජනාවක් ලෙස ඇතුලත් කර ශෝකය පල කිරීමට බලාපොරොත්තු වූ බවත් , පැල්මඩුල්ලට විශාල සේවයක් කළ එතුමාගේ වියෝව විශාල පාඩුවක් බවත් , එතුමාගේ දේශපාලන කාලය තුළ පක්ෂ පාට භේදයකින් තොරව සියලු දෙනා සමඟ ම සුහදව කටයුතු කළ අයෙක් නිසා සියලු දෙනාගේ ම ඇගයීමටත් ගෞරවයටත් පත් නායකයෙක් බවත් ය.

ඊළඟ සභා වාරයේ දී න්‍යාය පත්‍රයට යෝජනාවක් ලෙස ඇතුලත් කර කතා බහා කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ද පවසන ලදී.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගතිය සාකච්ඡා කිරීම.**

ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ගරු මන්ත්‍රීවරුන්ට උත්සව අත්තිකාරම් ලබා දීම සම්බන්ධව විමසා සිටින ලදී.ඒ සම්බන්ධව අදහස් දක්වීමන් ගරු සභාපතිතුමා පවසා සිටියේ පෙර වර්ෂ වල මෙන් නොව මෙවර උත්සව අත්තිකාරම් අයදුම්පත්‍රයෙහි සාක්කිය වෙනුවෙන් රාජ්‍ය නිලධාරී දෙදෙනෙක්ගේ අත්සන් අවශ්‍ය වන බව ය.

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වයෙ හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය හට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 මැයි 12 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තූති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපති තුමන්, විපක්ෂ නායක තුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත්, ජනමාධ්‍යවේදී මහතුන්ට ද, ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ස්තුතිය පුද කරමින් වාසනාවන්ත සුභ අළුත් අවුරුද්දකට සියළු දෙනාට ම සුභ ප්‍රාර්ථනා එක් කරමින් සිය ස්තුති කථාව අවසන් කරන ලදී.

**පෙ.ව. 10.55 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

වාර්තා ගත කළේ

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022-04-20 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

ප්‍රාදේශීය සභා .................................................................. මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ....................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-05-19 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව